**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**
# ශ්‍රී ලංකා පොලීසිය

# ලංසු ආරාධනය (IFB)

## ශ්‍රී ලංකා පොලීසිය සඳහා නව සිංගල් කැබ් රථ (BRAND NEW SINGLE CABS) 200 ක් ප්‍රසම්පාදනය
## ප්‍රසම්පාදන අංකය : PS/03/PB/PR/07/53/2025

01. සභාපති, ඉහල මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව විසින් ශ්‍රී ලංකා පොලීසිය සඳහා නව සිංගල් කැබ් රථ 200 ක් ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම්ලත් හා අවශ්‍යතා සපුරා ඇති ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ තනි අදියර තනි කවර ක්‍රමය අනුව සිදු කරනු ලබයි.

03. ප්‍රසම්පාදන උපලේඛනය

| ප්‍රසම්පාදනයේ නම | ලංසු ඇපකරයේ වටිනාකම | ආපසු නොගෙවන ලිපි ලේඛන ගාස්තුව | ලංසු භාර ගැනීමේ අවසාන දිනය | පූර්ව ලංසු රැස්වීම |
|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා පොලීසිය සඳහා නව සිංගල් කැබ් රථ 200 ක් ප්‍රසම්පාදනය** | රු.15,650,000.00 | රු.100,000.00 | 2026.08.07 දින පැය 14.00 | 2026.07.17 දින පැය 11.00 ට බත්තරමුල්ල, සුහුරුපාය,17 වන මහල, මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, ශ්‍රවණාගාරයේ දී පැවැත් වේ. |

04. උනන්දුවක් දක්වන සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා පොලිසියේ යාන්ත්‍රික ඉංජිනේරු (ප්‍රවාහන කොට්ඨාසය) වෙතින් **011 2588978 දුරකථන අංකය හෝ (dir.transport@police.gov.lk)** විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ ලබාගත හැකිය. එසේම, වැඩ කරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා බත්තරමුල්ල, සුහුරුපාය, 17 වන මහලේ පිහිටි මුදල් අංශයෙන් ද වැඩිදුර තොරතුරු ලබාගත හැකිය. ලංසු භාරගැනීමේ අවසන් දිනය දක්වා වැඩ කරන දිනවල ඉහත ලිපිනයේදී ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකි අතර, අපගේ නිල වෙබ් අඩවිය **(www.pubsec.gov.lk)** ඔස්සේ ද ඒවා පරීක්ෂා කළ හැකිය.

05. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් සහ ආපසු නොගෙවන ලේඛන ගාස්තුව මුදලින් ගෙවීමෙන්, **2026.07.09 දින සිට 2026.08.06 දින දක්වා** රජයේ වැඩ කරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා, බත්තරමුල්ල, සුහුරුපාය, 17 වන මහලේ පිහිටි මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය.

06. ලංසු **2027.01.29** දින දක්වා වලංගු විය යුතුය. සියලුම ලංසු සමඟ ශ්‍රී ලංකා **රුපියල් 15,650,000.00** ක ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු අතර, එය **2027.02.26** දින දක්වා වලංගු විය යුතුය. එම ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති සහ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන දේශීය වාණිජ බැංකුවක් මඟින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති සහ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විදේශීය වාණිජ බැංකුවක් මඟින් නිකුත් කර තිබිය යුතුය.

07. 1987 අංක 03 දරන රජයේ පොදු කොන්ත්‍රාත් පනතට අනුකූලව, ලංසුකරු, නියෝජිතයා, උප නියෝජිතයා හෝ ලංසුව වෙනුවෙන් කටයුතු කරන නම් කරන ලද ඕනෑම පුද්ගලයෙකු අවශ්‍ය ලියාපදිංචිය නිසි පරිදි සම්පූර්ණ කර තිබිය යුතුය.

08. ලංසු **2026.08.07 දින ප.ව. 2.00** ට හෝ ඊට පෙර, බත්තරමුල්ල, සුහුරුපාය, 17 වන මහලේ පිහිටි මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ මුදල් අංශය වෙත භාර දිය යුතුය.

09. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ලංසු භාරගැනීමේ අවසන් වේලාවෙන් අනතුරුව වහාම, බත්තරමුල්ල, සුහුරුපාය, 17 වන මහලේ පිහිටි මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ මුදල් අංශයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුට හෝ ඔහුගේ/ඇයගේ නිසි පරිදි බලය පවරන ලද නියෝජිතයෙකුට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය.

**සභාපති,**
**ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව (HLPC),**
**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,**
**18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.**
**2026.07.09**

@SELACINE